<u>**3.0 නාට්‍ය හා රංගකලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හි නියැළෙයි.**</u>

<u>**3.2 නිර්දිෂ්ට පෙළ ඇසුරින් විවිධ චරිත නිරූපණය කරයි.**</u>

<u>**"පෙළ කියවමු"**</u>

දහය ශ්‍රේණියට අදාළ නාට්‍ය හා රංග කලාව විෂය පථය ආවරණය කරන ඔබ ,නිර්දිෂ්ට නාට්‍ය පිටපත ලෙස දික්තල කාළගෝල නාට්‍ය පිටපත හැදෑරිය යුතුව ඇත.ඉතා ඉහළ නාට්‍යමය රසයකින් යුතු මෙම නාට්‍ය පිළිබඳව ඔබ මීට පෙර අසා තිබෙන්නටද මෙම නාට්‍ය නරඹා තිබෙන්නටද හැක.නමුත් මෙම පාඩම් මාලාව අවසානයේ ඔබට දික්තල කාළගෝල නාට්‍ය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත.

දික්තල කාළගෝල නාඩගමෙහි පිටපත ප්‍රතිභාපූර්ණ නාඩගම්කරුවකු වූ චාල්ස් සිල්වා ගුණසිංහයින් අතින් ලියැවී ඇත.චාල්ස් සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ යනුවෙන් ඔහු හැඳින්වූ අතර ඔහු අතින් නාට්‍ය කෘති 20ක් පමණ රචනා වී ඇතැයි පැවසෙයි.**රාමායනය,හරිස්චන්ද්‍ර,විදුර,සිංහවල්ලි** වැනි නාඩගම් ඔහු නිර්මාණය කොට ඇත.



<u>**දික්තල කාළගෝල නාට්‍යයට පදනම් ව ඇති කතා පුවත**</u>

මෙහි එන කතා වස්තුව පන්සිය පනස් ජාතක කතා පොතෙහි උම්මග්ග ජාතකයේ **කාළගෝල ප්‍රශ්ණය** යන අතුරු කතාවෙහි ඇසුරෙන් නිර්මාණය වූවකි.මෙහිදී ජාතක කතා කරුවාගේ ප්‍රධාන අරමුණ වූයේ බෝධිසත්ව චරිතයේ එන බුද්ධිමත් බව පෙන්වා දීමයි. ජාතක කතාවේ ප්‍රධාන චරිතය මහෞෂධ පඬිතුමාට හිමි වුව ද නාඩගමෙහි ප්‍රධාන චරිතය කාළගෝලට හිමි වෙයි.ජාතක කතාවේ ගැටලුව විසඳෙන්නේ දික්තලා කාළගෝලට හිමි වීමෙන් උවද නාඩගමෙහි අවසානයේදී සත්‍ය වටහා ගන්නා කාළගෝල දික්තලාට සිය සිත් ගත් දික්පිටියා සමඟ යෑමට අවසර ලබා දෙයි.

නාඩගම් වල දැකිය හැකි තෝඩායම වැනි පොතේ ගුරු පැමිණ සිදු කරනු ලබන පූර්ව ගායනාවන් නාට්‍යයේ ද දැකගත හැකිය.ගායනා කණ්ඩායම අත්වැල් ගායනයන් සපයයි.පොතේගුරු නලුවන්ගේ ප්‍රධානියයි.නාඩගම් මෙන් කතාව ඉදිරිපත් කිරීම,පාත්‍ර වර්ගයා හඳුන්වා දීම ,නාට්‍යයේද දැකගත හැකිය.නාඩගම් වල දක්නට ලැබෙන ස්ථාවර පාත්‍රයින් සියල්ල ම දක්නට නැතත් බහුබූත කෝලමෙහි පැමිණීම දැකගත හැකිය.සංවාදයන් නාට්‍ය ධර්මී ශෛලියෙන් ඉදිරිපත් කරනු ලබයි.පසුතලයන් දැකගත නොමැතිවා සේම රංගභාණ්ඩයන් භාවිතා වන්නේ ද නැත.නාට්‍යයේ වේදිකාව භාවිතය නාඩගමෙහි මෙන්ම මද්දල තාලයට අනුව සිදු වෙයි.චරිත හඳුන්වා දීම මෙන් ම වටයක් ගොස් ගමන අවසන් වූවායැයි පැවසීම මෙහිදීද සිදුවෙයි.

දික්තල කාළගෝල නාට්‍යයේ සමස්ත විස්තරය පිළිබඳව අප ඉදිරි පාඩමක දීද සාකච්චා කරමු.එතෙක් දික්කල කාළගෝල නාට්‍යයේ වැඩි දුර විස්තරයන් සඳහා පහත සබැඳිය වෙත පිවිසෙන්න.

https://youtu.be/0ei4fRF9KUg

මෙම පාඩම තුළින් බලාපොරොත්තු වන්නේ ඔබට සමස්ත පෙළ පිළිබඳව අවබෝධයක් ලබා දී සඳහා පෙල කියවීමට යොමු කරවීමයි.

දික්තල කාළගෝල නාට්‍යයේ

★පොතේ ගුරු_=බහුබූත කෝළම දක්වා

★පොතේ ගුරු _-දික්පිටියා හමු වන තෙක්

★පෙතේ ගුරු -දික්පිටියා හා දික්තලා ගඟෙන් එගොඩ වීම දක්වා

★මහෞෂධ පඬිතුමා වෙත යාම දක්වා

★නඩු විභාගය වෙත දක්වා කොටස් කියවීම මෙම කොටසේ දී සිදු වෙයි.ඒ සඳහා ආදර්ශ පෙළ කියවීමක් පහතින් අමුණා ඇති අතර දික්තල කාළගෝල නාට්‍ය පිටපත ද සහය කරගනිමින් පෙළ කියවීමෙහි යෙදෙන්න.

https://youtu.be/PknpM-IFSpU